# ලෝකෙට ලොක්කෝ

## දහසක් මල්

ප්‍රසේනජිත් තෙන්නකෝන් විසිනි.

ලෝකයේ මිනිසුන් පහල වුනද ඉදලම පවතින දෙයක් හැටියට කුතුහලය හඳුන්වන්න පුළුවන්. මේ නිසාම බොහෝමයක් දේවල් ගැන මිනිස්සු විමසිල්ලෙන් බලා ඉන්නවා. මේ විමසිලි බව නිසාම බොහෝ මිට අළුත් අළුත් දේවල් පුදුම හිතෙන දේවල් නොයෙක් වර සොයාගන්න ලැබෙනවා. මේ කුතුහලය කොච්චර ප්‍රබල දෙයක්ද කියලා අපට හිතෙන්නේ මෙවා ගැන ලියවුනු පොත්පත් වලට තියෙන ඉල්ලුම ගැන දකිනවිටයි. ඉතින් මේ වගේ විශේෂ දේවල් කිහිපයක් ගැන දැනගන්න ආසාවෙන් ඉන්න කෙනෙක් වෙන්න පුළුවන් ඔබත්.

එහෙම නම් ඔබ දැනගෙන හිටියද ආහාර හා පෝෂණය ගැන කතා කරන කොට ලෝකයේ වැඩිම කැලරි ප්‍රමාණයක් ආහාරයට ගන්න රට මොකක්ද කියලා. ඒ තමයි අයර්ලන්තය එහි එක පුද්ගලයෙක් සාමාන්‍යයෙන් දිනකට 3,450 කැලරි ප්‍රමාණයක් පරිභෝජනය කරනවා. වැඩිම කැලරි ප්‍රමාණයක් රැඳිලා තියෙන ආහාර පදර්ථය හැටියට දැනට සලකනු ලබන්නේ 'සඬමෙද' ග්‍රෑම් 100 ක (අවු. 3.5 ක) කැලරි 930 ක ප්‍රමාණ අඩංගු වෙනවා. ඒ එක්කම ඇල්කොහොල් ග්‍රෑම් 100 ක කැලරි 710 ක් රැඳි තිබෙන බව වාර්තා වෙනවා.

හැබැයි ප්‍රෝටීන් පරිභෝජනය අතින් නම් මුල්තැන ලබාගෙන තියෙන්නේ ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය. මෙම රටවල් දෙකේම එක් පුද්ගලයෙක් දිනකට ප්‍රෝටීන් ග්‍රෑම් 107 ක් (අවුන්ස 3.79) පරිභොජනය කරනු ලබන අතර එක්සත් රාජධානියේ මෙම ප්‍රමාණය ග්‍රෑම් 88 ක් (අවුන්ස 3.1) බව වාර්තාවී තිබෙනවා. එතකොට ලෝකයේ අඩුවෙන්ම ප්‍රෝටීන් පාවිච්චි කරන රට හැටියට සලකනු ලබන්නේ 'සයිරේ' රාජ්‍යයයි. එහි එක් පුද්ගලයෙක් දිනකට ලබාගන්නේ ග්‍රෑම් 33 (අවුන්ස 1.7 ක්) පමණයි. ලිබියාව ගැන සඳහන් කරන්නේ කැලරි අඩුවෙන්ම පරිභොජනය කරන රට හැටියටය 1960 සහ 1962 දී ගණන් බැලූ ආකාරයට එක පුද්ගලයෙකුට වැටෙන කැලරි ප්‍රමාණය 1730 ක් බව වාර්තා කරගෙන තිබෙනවා.

සීනි කන්න හපන්නු ඉන්නේ ඊශ්‍රායලේය. එහි එක් පුද්ගලයෙක් දිනකට සාමාන්‍යයෙන් ග්‍රෑම් 200 ක් (අවුන්ස 7.10 ක්) පරිභෝජනය කරන බව සඳහන් වෙනවා. මේ එක්කම අඩුවෙන්ම සීනි පරිභෝජනය කරන රට හැටියට 'චීනය' හඳුන්වා දී තිබෙනවා. චීන වැසියෙක් දිනකට පාවිච්චි කරන්නේ ග්‍රෑම් 13.1 (අවුන්ස 0.45) ක් තරම් අඩු ප්‍රමාණයක්.

මස් පරිභෝජනය කරන රටවල් අතරින් 'උරුගුවේ' රාජ්‍යය ලෝකයෙන්ම මුල් තැන දිනාගන්නේ එක් පුද්ගලයෙක් දිනකට ග්‍රෑම් 309 ක් අවුන්ස 10.93) පරිභොජනය කරලා. 1968 ගනන් බැලීමකට අනුව ලෝකයේ අඩුම මස් පරිභෝජනය කරන රට හැටියට හඳුන්වා ගෙන තිබෙන්නේ ශ්‍රී ලංකාව. අපේ වැසියෙක් දිනකට සාමාන්‍යයෙන් ග්‍රෑම් 0.45 (අවුන්ස 0.16) ක් මස් පරිභෝජනය කරන බව එම වාර්තාවේ සඳහන් කරලා තිබුනා.

රස කැවිලි අනුභව කරන රටවල් අතරින් මුල්ම තැන දිනාගෙන තිබෙන්නේ මහා බ්‍රිතාන්‍ය යයි. එහි එක් වැසියෙක් සාමාන්‍යයෙන් සතියකට ග්‍රෑම් 221 ක් (අවුන්ස 7.8 ක්) රස කැවිලි අනුභව කරනවලු. හැබැයි දත්වල දුබල තාවයන් ගැන නම් මහා බ්‍රිතාන්‍යය මුලට එන්නේ නැති එක ගැන නම් අපිට පුදුමත් හිතෙනවා.

බීම ගැන කතා කරන කොට අපිට මතක් වෙන්නේ ඉස්සෙල්ලාම කෝපි. ඉතින් ඔබ දන්න වාද කෝපි බොන්න රුසියෝ ඉන්නේ කොහේද කියලා. 1973 දී මේ ගැන කරපු පරීක්ෂණයකට අනුව ලෝකයේ වැඩිම කෝපි බොන අය ඉන්නේ

ස්විඩනයේ, එක් එක් වැසියෙක් සාමාන්‍යයෙන් කිලෝ ග්‍රෑම් 13.75 ක් (අවුන්ස 29.85) ක් කෝපි පරිභෝජනය කර ඇති බව වාර්තා වෙනවා· වතුර නම් වැඩිම ප්‍රමාණයක් පාවිච්චියට ගැනෙන්නේ ඇමෙරිකන් එක්සත් ජනපදයයි. 1973 දී එම රටේ ජනතාව සහ කර්මාන්තශාලා වල පාවිච්චි කිරීම සඳහා ගැළුම් 317540 ක් අවශ්‍ය වෙලා තිබෙනවා. එගි එක් පුද්ගලයෙක් දිනකට සාමාන්‍යයෙන් වතුර ගැලුම් 1855ක් පරිභෝජනය සඳහා යොදගනු ලබනවා.

වාර්තාවී ඇති රටවල් අතුරෙන් බටහිර ජර්මනිය ලෝකයේ වැඩියෙන්ම බීර පරිභෝජනය කරන රට වශයෙන් සැලකෙනවා. එහි වැසියෙක් දිනකට බීර ලීටර් 385.7ක් පරිභෝජනය කරන බවට වාර්තාවී තිබේ. ඒ වගේම පුදුම හිතෙන කතාවක් තමයි කිලෝ ග්‍රෑම් 18143 ක් (රාත්තල් 40,000) බර කේක් ගෙඩියක් තිබුනා කියන එක. එහෙත් ඇමරිකා එක්සත් ජනපදයේ 'පිලඩෙල්පියා'හි 1976 ජුලි 13 ද එම කේක් ගෙඩිය සාද නිමකරනු ලැබුවා. මෙහි උස මීටර් 15.24 (අඩි 50) වූන අතර පලල මීටර් 12.80 ක් (අඩි 42) වූනා. එමෙන්ම මෙයින් පුද්ගලයින් 20,000 කට සංග්‍රහ කරන්නත් හැකිවුනා. ලෝකයේ ලොකුම බිත්තර ඔම්ලට් එක නිර්මානය කරන්න වැයවූ බිත්තර ප්‍රමානය 6700 ක්. මේ සඳහා මීටර් 50 ක් (අඩි 16.5) විෂ්කම්භය ඇති තාච්චියක් යොද ගන්න සිදුවූ අතර තෙල් ලිටර 30 ක්ද අරක්ඇමියන්6 දෙනෙකුට පැය 2 මිනිත්තු 18ක්ද වැය කරන්න සිදුවූ බව වාර්තාවේ. මෙය නිර්මානය කල රට බෙල්ජියමයි·

ඔබ අලිගැට පේර ආහාරයට ගන්නා එක දවසක්වත් හිතුවද ලෝකයේ වැඩිම පෝෂ්‍යදයි පලතුර එයවූ බව. එහෙත් ඒක සත්‍යයක්. පලතුරු වර්ග 38 පරීක්ෂණයට භාජනය කරලා මෙය දැනට තහවුරු කරලා තියෙනවා. අලිගැට පේර ග්‍රෑම් 100 ක කැලරි 163 ක්ද විටමින් *A* සහ *C* ත් ප්‍රෝටීන් 2.2% කුත් මෙහි අඩංගු වෙනවා, එහෙත් පිපිඤ්ඤා තමයි අඩුම පෝෂ්‍යදයිකත්වයක් තිබෙන ගෙඩි වර්ගය. එහි ග්‍රෑම් 100ක තිබෙන්නේ කැලරි 16 පමණයි.

කෘෂිකර්මාන්තය ගැන කතා කරනකොට පැරණිම ධාන්‍ය වගාව කරලා තිබෙන බව සඳහන් වෙන්නේ ඉරානය සහ ජෙරිකෝ යන ස්ථානයයි. ක්‍රිස්තු පූර්ව 7000දී පමණ ඈත අතීතයේ එම ස්ථානවල ධාන්‍ය වගා කළ බවට සාධක දැන් සොයාගෙන තිබෙනවා. මේ එක්කම ගෘහාශ්‍රිතව



මන්නාරමේ බැවොබැබ් ගස – වටින් අඩි 50ක් තරම්ය.

එළුවන් ඇතිකිරීම ක්‍රි. පූ. 8050 දී ඉරාණයෙත් ක්‍රි. පූ.7000 දී ඌරන් ඇතිකිරීම ග්‍රීසියෙත් කලබව ඔබ මීට පෙර දනගෙන ඉන්න නැතුව ඇති නේද?

ලැලි අඩි 600120 කුත් ගිනිකූරු 5000000000 කුත් නිපදවිය හැකි ගසක් ලෝකයේ දනට තියෙනවා කියා කිවුවොත් ඔබ එක පාරටම කියාවි ඒක අසත්‍යයක් කියලා. එහෙත් කැලිපෝර්නියාවේ 'ස්කුවායි' කියන ජාතික වන උද්‍යානයේ තිබෙන ''ජෙනරල් ෂර්මන්'' කියන ලෝකයේ විශාලම ගසින් තමා ඒ පුදුම වැඩේ කරන්න පුළුවන්. මෙම ගස පොලව මට්ටමේ සිට මීටර් 1,52 (අඩි 5) ක් උසින් එහි වට ප්‍රමාණය මීටර් 24,11 (අඩි 79. 1) වෙන බව වාර්තා කරනවා. ලෝකයේ තිබෙන උසම ගස වැවෙන්නෙත් කැලිපෝනියාවේමයි එහි වෙරලබඩ වැවෙන රෙඩ්වුඩ් වර්ගයට අයත් ගසක් සාමාන්‍යයෙන් අඩි 310 උසට වැවෙනවා. 1970 දී කැලිපෝනියාවේ හම්බෝල්ට් ප්‍රදේශයේ තිබී මීටර් 111,60 (අඩි 366.2) උස ගසක් හමුවී තිබුනා. ඒ වගේම බ්‍රිස්ටල් කෝන් පයින් වර්ගයට අයිති ගසක් ලෝකයේ පැරණිම ගස හැටියට වාර්තා වී තිබෙනවා, කැලිපෝනියාවේ තිබී හමුවූ මෙම ගස දනට අවුරුදු 4600 ක වයස ප්‍රමාණයක් ගෙවා තිබෙන බව සඳහන් කෙරෙනවා. කොහොම වුනත් ලෝකයේ පුදුම හිතෙන ගස් හැම එකක්ම පාහේ වැවෙන්නේ කැලිපෝනියාවේ වීම තවත් පුදුමයක්.

දකුණු බුරුමය ආශ්‍රිතව වැවෙන 'ඩෙන්ඩ්‍රෝ කැලමස් ගිගනාටස්' කියන උණගස් වර්ගය දනට ලෝකයේ තිබෙන වැඩිම උස යන උණගස් හැටියට නම් දරා තිබෙනවා. ඒ එක්කම මෙම වර්ගයේ තියෙන උසම ගස සොයාගෙන තිබෙන්නේ අපේ රටෙන් කියන එක සන්තෝසයට කරුණක්. පේරාදෙණියේ උද්භිද උද්‍යානයේ ඇති මෙම වර්ගයට අයිති ගසක් අඩි 115 ක් උසට වැවී තිබුනු බව වාර්තා වී තිබුනා. ලෝකයේ විශාලම වනාන්තරය පිහිටා තිබෙන්නේ ''සෝවියට් රුසියාවේ'' එහි උතුරු කොටසේ ඇති 'කොනි පෙරස්' වනාන්තරය හෙක්ටයාර් දශ ලක්ෂ 1,010 ක් (අක්කර 2,700,000,000) පුරා පැතිර පවතින අතර මෙම ප්‍රමාණය ලෝකයේ වනාන්තර වලින් 25% ක ප්‍රමාණයක් වෙනවා.

අමෙරිකාවේ අරිසෝනා ප්‍රාන්තයෙ පිහිටා තිබෙන 'ලෝඩ් බෑන්ක්' කියන රෝස පඳුර ලෝකයේ විශාලම රෝස පඳුර හැටියට හඳුන්වා දී තිබෙනවා. මෙය වර්ග මීටර් 499 ක් (වර්ග අඩි 5380) ක් වසාගෙන පැතිරී තිබෙන අතර මෙය විශාල කනු 68 ක් මත රඳවා තිබෙනවා. මෙම පඳුර යට මිනිසුන් 150 කට පහසුවෙන් අසුන් ගන්නට පුළුවන්ලු. මෙතෙක් ලෝකයේ විශාලම මල් පොකුර සාද තිබෙන රට හැටියට සැලකෙන්නේ නවසීලන්තයයි. මෙය කිලෝ ග්‍රෑම් 457 ක් (රාත්තල් 1,008) ක් බරින් යුක්ත වූ අතර විෂ්කම්භය අඩි 25 ක් වී තිබුනා.

ගොඩබිම ඉන්න සත්වයන් අතරින් වේගයෙන් දුවන සතා හැටියට හඳුන්වනු ලබන්නේ 'චීටා' ඇප්සනිසථානය දකුණු අප්‍රිකාව හා තුර්ක්මේනියාව යන රටවල තැනිතලා ආශ්‍රයකරගෙන වාසය කරන මෙම සතුන්ගෙ සාමාන්‍ය වේගය පැයකට කිලෝ මීටර් 96-101 (සැත. 60-63) වෙනවා. එහෙත් බාධක රහිත බිමක නම් මොවුන්ට පැයකට කිලෝ මීටර් 114-135 (හැ. 71-84) ක් දක්වා වේගයකින් දුවන්න හැකිවෙනවා

(දනට පෘතිවියේ ජීවත්වෙන විශාලම සත්වයා හැටියට සැලකෙන්නේ 'නිල් තල්මසා' හොඳට වැඩුනු මෙම වර්ගයේ සතෙක් සාමාන්‍යයෙන් ටොන් 160 ක් පමණ බරකින් යුක්ත වෙන බව දනට සොයා ගෙන තිබෙනවා. මෙතෙක් මේ වර්ගයට අයත් ලොකුම සත්වයා ගැන වාර්තා වී තිබෙන්නේ 1920 දී දකුණු ජෝර්ජියාවේ ආර්ජන්ටිනාවේ පෙස්තා' යන සථානයේ සිට මෙම සත්වයා මීටර් 33.58 (අඩි 110) ක් දිග ප්‍රමාණයකින් යුක්ත වූ බව වාර්තා වි තිබෙන්නේ 1920 දී, ගොඩබිම වෙසෙන විශාලම සත්වයා හැටියට නම් දරා සිටින්නේ 'අප්‍රිකානු බුල් එලිපන්ට්' කියන අලි වර්ගය මෙම වර්ගයේ වැඩුනු සතෙක් මීටර් 3520 ක් (අඩි 10) පමණ උස වෙන අතර ටොන් 5, 6 සිට 5.7 දක්වා බරකින් යුක්ත වෙනවා.

ඉතින් ඔබ දන් පුදුම හිතෙන දේවල් කිහිපයක් දන ගන්න ඇති. මේ ප්‍රමාණය ලෝකයේ පුදුම හිතෙන දේවල් වලින් ඉතාමත් ස්වල්පයක් විතරයි. ඔබට ඉදිරියේදීත් මේ වගේ සාමාන්‍ය දනීම වර්ධනය කරන්න ඉවහල් වන දේවල් ඉඩකඩ ලැබෙන හැටියට පලකරන්න අප බලාපොරොත්තු වෙනවා. හැබැයි එතකොට ඔබට සමහර විට පුදුම හිතෙන්න පුළුවන් මේ වගේ පුදුම හිතෙන දේවල් ලෝකයේ මෙච්චර තියෙනවද කියලා.